සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

12 ශ්‍රේණිය

## සිංහල - I

පිළිතුරු පත්‍රය

(01) (අ) (1) දරුවා ප්‍රසූත කරන්න තමා දෙමාපියන් නිවසට රැගෙන යාම සඳහා.

(2) සිටු ගෙයි මෙහෙකරුවෙකුව හිඳ 'සිටු කුමරිය' රැගෙන රහසේ පලා යාම.

(3) සිටුකුමරියගේ දෙමාපියන් ළඟට / සිටු මැඳුරට / දෙමාපිය්න ළඟට.

(4) සමුණන්ට ස්වාමියාට
මා ඔබ යන්ට මට එහි යන්නට (ල.04)

(ආ) (1) සැවැත් නුවර සිටු මැඳුර වර්ෂාවෙන් කඩා වැටීම නිසා මළ සිටුතුමා, සිටුදේවි හා සිටුපුත්‍රයා දවන සොහොනේ දුම / පටචාරාවගේ දෙමාපියන් හා සොයුරාගේ දැවෙන සොහොනේ නගින දුම.

(2) සැවැත් නුවර සිටුතුමා, සිටුදේවි, සිටුපුත්‍රයා / පටාචාරවගේ මාපිය දෙදෙනා හා සොයුරා.

(3) නිර්වස්ත්‍ර ව, උමතු බවට පැමිණි තැනැත්තියකැයි සිතා

(4) හුණු පිළීත් වැටුණු වස්ත්‍ර
හිස ඔනෝ හිසට වැදෙන්ට / ඔලුවට වැටෙන්නට (ල.04)

(ඉ) (1) අවුරුදු 67 සිට 100 දක්වා වයස් සීමාව.

(2) සුගන්ධකුටියේ / බුදුන් වසන සුවඳ කුටියේ

(3) රූප අරූප ආදී පංචස්කන්ධයෙන්

(4) ආමන්ත්‍රණාර්ථයේ නිපාත / ආලපන විභක්ති (ල.04)

(ඊ) (1) මගේ මිතුරාගේ ශරීර ශ්‍රියාවෙන් බැබළීම / ගිරවාගේ සිරුරේ බැබළීම.

(2) කාන්තාවන්ගේ යහපත් තොල්වලට / කතුන්ගේ සුන්දර යටිතොලට

(3) ප්‍රිය වූ කාන්තාවන්ගේ අත්වල ස්පර්ශය / කතුන්ගේ ප්‍රියංකර ස්පර්ශය

(4) රඳව විධි ක්‍රියා
කෙළ කෙළ මිශ්‍ර ක්‍රියා (ල.04) (4 × 4 = 16)

(උ) අවස්ථා සම්බන්ධය පිළිතුරු

(1) ධර්මසේන හිමියන්ගේ සද්ධර්මරත්නාවලියේ පටාචාරා වහන්දැගේ වස්තුවේ එන්නකි. සිටු දියණිය තමා වෙනත් සිටුපුත්‍රයෙකු සරණයට නියම ව තිබූ බැවින් ඊට පෙර, තමාට ප්‍රේමයක් ඇත්නම් තමා රැගෙන කොතැනක හෝ යැන්නැයි ගෙයි මෙහෙකාර කොළුවාට (පෙම්වතාට) පැවසූ පසු, මෙහෙකාර කොලුවා සිටු දියණියට ඒ සඳහා දෙන පිළිතුරකි. (ල. 02)

(2) පන්සිය පනස් ජාතක පොතේ එන ඡද්දන්ත ජාතකය් එන්නකි.
ඡද්දන්ත ඇතා සල් වනයෙහි කෙළිමින් සිටියදී දළෙන් පහරන ලද සල් රුකෙන් වැටුණ දිමි කැලු, කසල, පරඬලාපත්, තම සිරුරේ වැටුණු විට කෝප වූ චුල්ල සුභද්‍රා ඇතින්න, මහා සුභද්‍රාවගේ සිරුරට වැටුණු මල් රොන් හා මල් පෙති දැක ඒ ගැන ඇතු කෙරේ වඩාත් කෝපයෙන්, වෛර බැඳ සිතූ සිතුවිල්ලකි. (ල. 02)

(3) සද්ධර්මාලංකාරයේ සාලිරාජ වස්තුවේ එන්නකි. තිස්ස නවැමියා කර්මාන්ත මිල පිණිස ලත් උඟුරුමංසය දන් දීමට සිතූ දින, රෑ දුටු සිහිනය දැක සතුටු වී, උදෑසන අවදි වී, සිතූ සිතුවිල්ලකි. (ල. 02)

(4) එදිරිවීර සරච්චන්ද්‍රගේ මළගිය ඇත්තෝ නවකතාවේ එන්නකි. මිදෙරි අවන්හලට ගිය දෙවෙනි දින දෙවොන්දරා සං පිටස්තර අයට හඳුන්වාදෙමින්, එහි සේවය කළ වැඩිමහල් ස්ත්‍රීය කියුවකි. (ල. 02)

(5)

(6) ඩබ්. ඒ. සිල්වාගේ පුරුද්ද කෙටිකතාවේ එන්නකි. ගමේ උණ රෝගය වැළඳී තරුණියකගේ රෝගය සුවකිරීමට ගොස්, රෝග විස්තර අසා රෝග නිදානය අවබෝධවීමෙන් පසු තරුණියගේ මවට කියූ දෙයකි. (ල. 02) (ල.2×4 = 08)

02 06 දක්වා ප්‍රශ්නවලින් ප්‍රශ්න 4 කට පිළිතුරු ලිවිය යුතුය. එක් පිළිතුරකට ලකුණු 15 බැගිනි.